# ප්‍රවෘත්ති නිවේදනය

## පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමයේ සභාපතිත්වය යළිත් ශ්‍රී ලංකාවට

පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමයේ 51 වැනි සමුළුව 2011 සැප්තැම්බර් 15-16 දක්වා ට්‍රිනිඩෑඩ් හා ටොබැගෝහිදී පැවැත්වුණු අතර එහි සභාපතිත්වයට යළිත් වරක් ශ්‍රී ලංකාව ඒකච්ඡන්දයෙන් තේරිපත් විය.

පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමයේ 50 වැනි සමුළුව 2010 වසරේදී කොළඹදී පවත්වන ලද අතර එහිදී සභාපතිත්වයට තේරි පත්වූයේ ජනාධිපති ලේකම් හා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සභාපති ලලිත් වීරතුංග මහතායි. එතුමා වෙනුවෙන් ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ට්‍රිනිඩෑඩ් හා ටොබැගෝහිදී පවත්වන ලද 51 වැනි සමුළුවට සහභාගි වූ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් අනූෂ පැල්පිට මහතා මෙවර එහි සභාපතිත්වයට තේරි පත්විය.

අප්‍රිකානු රටවල් ඇතුළු පොදු රාජ්‍ය මණ්ඩලීය සාමාජික රටවල් රැසක සහයෝගිත්වය මත ශ්‍රී ලංකාව යළිත් වරක් පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමයේ සභාපතිත්වයට තේරි පත්වූ අතර මෙම 51 වැනි සමුළුව නියෝජනය කළ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් අනූෂ පැල්පිට මහතා ප්‍රකාශ කළේ ශ්‍රී ලංකාව පිළිබඳව විශ්වාසය තබා තවත් වසරක කාලයක් සඳහා සභාපතිත්වය පිරිනැමීම සම්බන්ධයෙන් සිය ස්තුතිය පිරිනමන බවයි. පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමයේ කටයුතු නව තවත් ශක්තිමත් කරමින් එහි අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා උපරිමයෙන් ක්‍රියා කරන බවත් ,නව ප්‍රධාන විධායක නිලධාරි මහාචාර්ය ටිම් අන්වින් සමග සම්පව ක්‍රියා කරමින් පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමය වැඩිදියුණු කිරීමේ දර්ශනය පෙරදැරිව එළදායි සැලසුම් රැසක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන බවත් ඔහු ප්‍රකාශ කළේය. පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමය ගෝලීය තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයේ ප්‍රමුඛයෙකු බවට පත් කිරීමට සාර්ථකව මග පෙන්වමින් සිය දැඩි පරිශ්‍රමය දැක්වූ හිටපු ප්‍රධාන විධායක නිලධාරි ආචාර්ය එක්වොව් ස්පියෝග්‍රාබ් වෙත ඔහු මෙහිදී සිය ස්තුතිය පළ කළේය.

පැල්පිට මහතා මෙහිදී වැඩිදුරටත් ප්‍රකාශ කළේ පොදු රාජ්‍ය මණ්ඩලයේ 51 වැනි වාර්ෂික සමුළුව සඳහා සත්කාරකත්වය දැක්වූ ට්‍රිනිඩෑඩ් හා ටොබැගෝ රජයන් විසින් ලබාදුන් පහසුකම් සහ සහ උණුසුම් පිළිගැනීම පිළිබඳව සිය ස්තුතිය පළ කරන බවයි ශ්‍රී ලංකාව පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමයේ සභාපතිත්වය දැරූ පසුගිය කාලය තුළ සිය අපරිමිත සහයෝගය දැක්වූ සාමාජිකයන්ට සහ විධායක සභාවට ස්තුතිය පළ කරන බවත් එළැඹෙන වසරේදීද ඉදිරි වැඩ කටයුතු සඳහා එකී සහයෝගිත්වය අපේක්ෂා කරන බවත් ඔහු පැවසීය.

එමෙන්ම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (බලපත්‍ර පරිපාලන) එච්. පී. කරුණාරත්න මහතාද ශ්‍රී ලංකාව වෙනුවෙන් මෙම සමුළුව සහ මහා සභා රැස්වීම නියෝජනය කළේය.

පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමය පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල විදුලි සංදේශ. තොරතුරු තාක්‍ෂණ හා ගුවන් විදුලි ප්‍රචාරණ කටයුතු මෙන්ම අන්තර්ජාල කටයුතු සම්බන්ධයෙන් දැනුම හුවමාරු කිරීම මෙන්ම විදුලි සංදේශ කටයුතුවල නියැළෙන ආයතනයකි. පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමය තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය භාවිතය පිළිබඳව උපදේශාත්මක සේවා සපයමින් තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ පාර්ශවකරුවන්ට සහාය වේ. පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමයේ මූලස්ථානය ලන්ඩනයේ පිහිටා ඇති අතර , පූර්ණ සහ ආංශික සාමාජිකත්වය දරන පොදු රාජ්‍ය මණ්ඩලීය සාමාජික රටවල් 50 කින් සමන්විත වේ.